# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 26 දරන

# ආදායම් බදු අධිභාර පනත

---

[සහතිකය සටහන් කළේ 1982 අගෝස්තු මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 අගෝස්තු මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල: ශත 65 යි        තැපැල් ගාස්තුව: ශත 50 යි

# 1982 අංක 26 දරන ආදායම් බදු අධිභාර පනත

**[සහතිකය සටහන් කළේ 1982 අගෝස්තු මස 10 වන දින]**

එල්. ඩී.—ඕ. 13/82

**1981 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්ද අය කරනු ලැබිය හැකි සෑම තැනැත්තකු වෙත ම, ඒ තැනැත්තා විසින් ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද අනුව අධිභාරයක් නියම කිරීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1982 අංක 26 දරන ආදායම් බදු අධිභාර පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මේ පනතෙහි "අදාළ වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්ද අය කරනු ලැබිය හැකි සෑම තැනැත්තකු ම, වෙනත් යම් ලිඛිත නීතියක හෝ යම් සම්මුතියක, ප්‍රදානයක හෝ ගිවිසුමක කුමක් සඳහන් වුව ද අදාළ වර්ෂය සඳහා ඔහු විසින් ගෙවනු ලැබිය යුතු ආදායම් බද්ද මත මේ පනතේ පළමු වන උපලේඛනයෙහි සඳහන් අනුප්‍රමාණ අනුව ගණන් බලන ලද අධිභාරයක් ගෙවීමට බැඳී සිටිය යුතු ය. ආදායම් බද්ද මත වූ අධිභාරය නියම කිරීම.

**3.** මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයේ සඳහන් යම් තැනැත්තකු, අදාළ වර්ෂය සඳහා තමාගේ බදු අයකළ හැකි ආදායම එම උපලේඛනයේ II වන තීරයේ අනුරූපී සටහනෙහි සඳහන් මුදල නොඉක්මවන තැනැත්තකු වශයෙන්— ඇතැම් අවස්ථාවල දී සහන.

(අ) අදාළ වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්දේ ; සහ

(ආ) මේ පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද මත වූ අධිභාරයේ

එකතුව,

(i) අදාළ වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ බදු අයකළ හැකි ආදායමේ සහ

(ii) එම උපලේඛනයේ III වන තීරයේ අනුරූපී සටහනෙහි සඳහන් මුදල

අතර වෙනස ඉක්මවන අවස්ථාවක, ඒ අතිරික්ත මුදල, මේ පනත යටතේ ඔහු විසින් ගෙවනු ලැබිය යුතු අධිභාරයේ මුදලින් අඩුකරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා, අදාළ වර්ෂය සඳහා තැනැත්තකුගේ බදු අයකළ හැකි ආදායම පිළිබඳ සෑම සඳහනක් ම, සමාගමක ඇවරකරුවකු සම්බන්ධයෙන් වන විට, ඔහු ඇවරකරු වන සමාගමේ අදාළ වර්ෂය සඳහා බදු අයකළ හැකි ආදායම් පිළිබඳ සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

2—ඒ 63864—15075 (82/06)

අධිභාරය ගෙවීම සඳහා වූ දිනය.

4. මේ පනත යටතේ අධිභාරය ගෙවීමට බැඳී සිටින සෑම තැනැත්තකු විසින් ම, ඔහු වෙත තක්සේරු කිරීමක් නිකුත් කර නොමැති වුව ද, ඔහු විසින් ගෙවිය යුතු අධිභාරයේ මුදලින් සියයට පණහකට නොඅඩු ප්‍රමාණයක් 1982 ජූලි මස 15 වන දින හෝ ඊට පෙර, සහ ඉතිරි ප්‍රමාණය 1982 නොවැම්බර් මස 30 වන දින හෝ ඊට පෙර ද කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

සේවායෝජක විසින් අධිභාරය අඩුකළ යුතු බව.

5. දේශීය ආදායම් පනතේ XV වන පරිච්ඡේදයේ විධිවිධාන වලට අනුකූලව (ඒ පනතේ 67 වන වගන්තියේ (7) වන උප වගන්තිය මගින් නිර්වාසිකයකු වශයෙන් සැලකෙන සේවා නියුක්තයකු නොවන) යම් සේවානියුක්තයකුගෙන් අදාළ වර්ෂය සඳහා ආදායම් බද්ද අයකළ හැක්කේ ද එවැනි සේවානියුක්තයකු සේවයෙහි නියුක්ත කරවන සෑම සේවායෝජකයකු විසින් ම, ඒ සේවානියුක්තයාට ගෙවනු ලබන පාරිශ්‍රමිකයෙන් පහත දැක්වෙන මුදල් ද 1982 ජූනි මාසයෙන් ආරම්භ වන මාසික වාරික හයකින් මේ පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද මත වූ අධිභාරය වශයෙන් අඩු කරනු ලැබිය යුතු ය—

(අ) දේශීය ආදායම් පනතේ 4 වන වගන්තියේ (ඇ) ඡේදයෙහි සඳහන් සේවානියුක්තියෙන් ලබන ලාභ කිසිවක් මත ගෙවිය යුතු ආදායම් බද්ද නොවන, ඒ සේවානියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් අදාළ වර්ෂය සඳහා අඩු කළ හැකි ආදායම් බද්ද රුපියල් හාර දහස් විස්ස ඉක්මවන නමුත්, රුපියල් දහ හතර දහස් දෙසියය නොඉක්මවන අවස්ථාවක, ඒ ආදායම් බද්දෙන් සියයට පහකට සමාන මුදලක් ;

(ආ) දේශීය ආදායම් පනතේ 4 වන වගන්තියේ (ඇ) ඡේදයෙහි සඳහන් සේවානියුක්තියෙන් ලබන ලාභ කිසිවක් මත ගෙවිය යුතු ආදායම් බද්ද නොවන, ඒ සේවානියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් අදාළ වර්ෂය සඳහා අඩු කළ හැකි ආදායම් බද්ද රුපියල් දහ හතර දහස් දෙසියයක් ඉක්මවන නමුත්, රුපියල් අනූ හයදහස් පන්සිය හැටක් නොඉක්මවන අවස්ථාවක, ඒ ආදායම් බද්දෙන් සියයට දහයකට සමාන මුදලක් ;

(ඇ) දේශීය ආදායම් පනතේ 4 වන වගන්තියේ (ඇ) ඡේදයෙහි සඳහන් සේවානියුක්තියෙන් ලබන ලාභ කිසිවක් මත ගෙවිය යුතු ආදායම් බද්ද නොවන, ඒ සේවානියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් අදාළ වර්ෂය සඳහා අඩු කළ හැකි ආදායම් බද්ද රුපියල් අනූ හයදහස් පන්සිය හැටක් ඉක්මවන අවස්ථාවක, ඒ ආදායම් බද්දෙන් සියයට පහළොවකට සමාන මුදලක්.

ආදායම් බද්දේ, ධන බද්දේ සහ අධිභාරයේ එකතුව එක්තරා සීමාවක් ඉක්මවන විට අධිභාරය අඩු කිරීම.

6. යම් තැනැත්තකු විසින්—

(අ) අදාළ වර්ෂය සඳහා ගෙවනු ලැබිය යුතු ආදායම් බද්දේ ;

(ආ) අදාළ වර්ෂය සඳහා ගෙවනු ලැබිය යුතු ධන බද්දේ ;

(ඇ) මේ පනත යටතේ ගෙවනු ලැබිය යුතු ආදායම් බද්ද මත වූ අධිභාරයේ ; සහ

(ආ) 1982 ධන බදු අධිභාර පනත යටතේ ගෙවිය යුතු, ධන බද්ද මත වූ අධිභාරයේ

එකතුව, ඒ වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමේ සහ දේශීය ආදායම් පනත හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් යටතේ ආදායම් බද්දෙන් නිදහස් වූ ලාභ සහ ආදායම වන්නා වූ ද, ඒ නිදහස් කිරීම නිසා නොවේ නම් අදාළ වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායම ආගණනය කිරීමේ දී සැලකිල්ලට ගනු ලැබිය හැකිව තිබුණා වූ ද (වාසස්ථානයක ශුද්ධ වාර්ෂික වටිනාකම සහ දේශීය ආදායම් පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් යම් සහනාධාරයක් නොවන) ලාභ සහ ආදායම් කිසිවක් එකතුවෙන් සියයට අසූවක් ඉක්මවන අවස්ථාවක, ඒ අතිරික්ත මුදලේ ප්‍රමාණය ආදායම් බද්ද මත වූ ඒ අධිභාරයට හෝ ධන බද්ද මත වූ ඒ අධිභාරයට හෝ ආදායම් බද්ද මත වූ ඒ අධිභාරයේ සහ ධන බද්ද මත වූ ඒ අධිභාරයේ එකතුවට හිලව් කරනු ලැබිය යුතු ය.

7. දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද සම්බන්ධයෙන් වූ වාර්තා සැපයීම, ආදායම් බද්ද අඩු කිරීම, ඒ බද්ද තක්සේරු කිරීම, තක්සේරු කිරීම්වලට විරුද්ධව අභියාචනා, ගෙවීම, අයකර ගැනීම සහ ආපසු ගෙවීම සම්බන්ධයෙන් ඒ පනතේ XIII වන පරිච්ඡේදයේ සහ XV වන පරිච්ඡේදයේ සිට XXVI වන පරිච්ඡේදය දක්වා ඇති පරිච්ඡේදවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ පනත යටතේ ගෙවිය යුතු අධිභාරය සම්බන්ධයෙන් වාර්තා සැපයීම, ඒ අධිභාරය අඩුකිරීම, තක්සේරු කිරීම, තක්සේරු කිරීම්වලට විරුද්ධව අභියාචනා, ගෙවීම, අයකර ගැනීම සහ ආපසු ගෙවීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. දේශීය ආදායම් පනතේ ඇතැම් විධිවිධාන අදාළ වන බව.

8. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි — අර්ථ නිරූපණය.

"තක්සේරු කළහැකි ආදායම", "පුණ්‍යායතනය", "කොමසාරිස් ජනරාල්වරයා", "පොල්මෑකරු", "ජනතා සමාගම", "තැනැත්තා", "ලාභ සහ ආදායම", "නිල ලැයිස්තු ගත පොදු සමාගම", "භාරගැනුම්කරු", "කුඩා සමාගම", "භාරකරු" හා "තක්සේරු වර්ෂය", යන යෙදුම්වල දේශීය ආදායම් පනතේ පිළිවෙළින් ඒවාට දී ඇති අර්ථයන් ම ඇත්තේ ය;

"සමුපකාර සමිතිය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද්දා වූ හෝ ලියාපදිංචි කරන ලද බව සැලකිය යුතු වූ සමුපකාර සමිතියක් අදහස් වේ;

"ස්වයෝජක", "සේවානියුක්තයා", සහ "පාරිශ්‍රමිකය" යන යෙදුම්වල දේශීය ආදායම් පනතේ XV වන පරිච්ඡේදයෙහි පිළිවෙළින් ඒවාට දී ඇති අර්ථයන්ම ඇත්තේ ය.

" ආදායම් බද්ද " යන්නෙන්, යම් තැනැත්තකු සහ අදාළ වර්ෂය සම්බන්ධයෙන්—

(අ) මේ පනතේ 2 වන වගන්තියෙහි සහ පළමුවන උප ලේඛනයෙහි ලා, සහ

(i) වාසික සමාගමකට අදාළව, දේශීය ආදායම් පනතේ 33 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ එම වර්ෂය සඳහා එම සමාගම විසින් ගෙවිය යුතු යම් ආදායම් බද්දක් වෙතොත් එය එම සමාගම විසින් අදාළ වර්ෂය සඳහා ඒ පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩු කළ විට ඇති වන ශේෂය අදහස් වේ;

(ii) නිර්වාසික සමාගමකට අදාළව, දේශීය ආදායම් පනතේ 34 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනු ඡේදය හෝ (ii) වන අනුඡේදය යටතේ එම සමාගම විසින් එම වර්ෂය සඳහා ගෙවිය යුතු යම් ආදායම් බද්දක් වෙතොත් එය එම සමාගම විසින් අදාළ වර්ෂය සඳහා එම පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩු කළ විට ඇති වන ශේෂය අදහස් වේ;

(iii) අදාළ වර්ෂය සඳහා වූ තමාගේ ලාභ සහ ආදායමට දේශීය ආදායම් පනතේ 4 වන වගන්තියේ (ඇ) ඡේදයෙහි සඳහන් සේවා නියුක්තියෙන් ලබන ලාභ ඇතුළත් වන, වාසික පුද්ගලයකුට අදාළව, සේවානියුක්තියෙන් ලැබූ ඒ ලාභ අදාළ වර්ෂය සඳහා වූ ඔහුගේ ලාභ සහ ආදායමේ කොටසක් නොවී තිබුණේ නම්, ඒ පුද්ගලයා විසින් දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතුව තිබුණු ආදායම් බද්ද අදහස් වේ;

(iv) දේශීය ආදායම් පනතේ 67 වන වගන්තියේ (7) වන උපවගන්තිය අනුව නිර්වාසිකයකු වශයෙන් සැලකෙන පුද්ගලයකුට අදාළව, අදාළ වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ දී සේවා නියුක්තියෙන් ලැබූ ඔහුගේ ලාභ, එම වර්ෂය සඳහා වූ ඔහුගේ ලාභ සහ ආදායමේ කොටසක් නොවූයේ නම්, ඒ පුද්ගලයා විසින් දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතුව තිබුණු ආදායම් බද්ද අදහස් වේ;

(v) වෙනත් යම් තැනැත්තකුට අදාළව, අදාළ වර්ෂය සඳහා ඒ තැනැත්තා විසින් දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද අදහස් වේ; තවද

(ආ) 3 වන සහ 6 වන වගන්තිවල, එම වර්ෂය සඳහා එම තැනැත්තා විසින් දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද අදහස් වේ ;

"දේශීය ආදායම් පනත" යන්නෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත අදහස් වේ ;

"තක්සේරු කළ හැකි ආදායම" යන්නෙන්, යම් තැනැත්තකු සහ අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව ආගණනය කරන ලද එම වර්ෂය සඳහා වූ එම තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායම අදහස් වේ ; තව ද—

(අ) අදාළ වර්ෂය සඳහා වූ තමාගේ ලාභ සහ ආදායමට දේශීය ආදායම් පනතේ 4 වන වගන්තියේ (ඈ) ඡේදයෙහි සඳහන් සේවා නියුක්තියෙන් වූ ලාභ ද ඇතුළත් වන වාසික පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට, සේවා නියුක්තියෙන් ලැබූ ඒ ලාභ එම වර්ෂය සඳහා වූ ඒ පුද්ගලයාගේ ලාභ සහ ආදායමේ කොටසක් නොවූයේ නම්, එම වර්ෂය සඳහා එම පුද්ගලයාගේ (දේශීය ආදායම් පනතේ විධිවිධාන වලට අනුකූලව ආගණනය කරන ලද) තක්සේරු කළ හැකි ආදායම විය හැකි වූ ප්‍රමාණය අදහස් වන සේ සලකනු ලැබිය යුතු ය ;

(ආ) දේශීය ආදායම් පනතේ 67 වන වගන්තියේ (7) වන උපවගන්තිය අනුව නිර්වාසිකයකු වශයෙන් සලකනු ලබන පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට, අදාළ වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ දී සේවා නියුක්තියෙන් ලැබූ ඔහුගේ ලාභ, එම වර්ෂය සඳහා වූ ඔහුගේ ලාභ සහ ආදායමේ කොටසක් නොවූයේ නම්, අදාළ වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ (දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව ආගණනය කරන ලද) තක්සේරු කළ හැකි ආදායම විය හැකි වූ ප්‍රමාණය අදහස් වන සේ සලකනු ලැබිය යුතු ය ;

"ධන බද්ද" යන්නෙන්, දේශීය ආදායම් පනත යටතේ පනවා අය කරනු ලබන ධන බද්ද අදහස් වේ.

### පළමුවන උපලේඛනය (2 වන වගන්තිය)

**ආදායම් බද්ද මත වූ අධිභාරයේ අනුප්‍රමාණ**

1. පුද්ගලයන් නොවන තැනැත්තන් සඳහා—

| | |
|---|---|
| (අ) අදාළ වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ බදු අය කළ හැකි ආදායම රු. 25,000 ඉක්මවන, නමුත් රු. 50,000 නොඉක්මවන අවස්ථාවක | අදාළ වර්ෂය සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් සියයට 5ක් |
| (ආ) ඒ තැනැත්තාගේ බදු අය කළ හැකි ආදායම රු. 50,000 ඉක්මවන අවස්ථාවක | අදාළ වර්ෂය සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් සියයට 10ක් |

2. පුද්ගලයන් සඳහා—

| | |
|---|---|
| (අ) අදාළ වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ බදු අය කළ හැකි ආදායම රු. 25,000 ඉක්මවන, නමුත් රු. 50,000 නොඉක්මවන අවස්ථාවක | අදාළ වර්ෂය සඳහා ඒ පුද්ගලයා විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් සියයට 5ක් |
| (ආ) අදාළ වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ බදු අය කළ හැකි ආදායම රු. 50,000 ඉක්මවන, නමුත් රු. 2,00,000 නොඉක්මවන අවස්ථාවක | අදාළ වර්ෂය සඳහා ඒ පුද්ගලයා විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් සියයට 10ක් |
| (ඇ) අදාළ වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ බදු අය කළ හැකි ආදායම රු. 2,00,000 ඉක්මවන අවස්ථාවක | අදාළ වර්ෂය සඳහා ඒ පුද්ගලයා විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් සියයට 15ක් |

### දෙවන උපලේඛනය (3 වන වගන්තිය)

**I වන කොටස**

(සියයට 5 අනුප්‍රමාණයේ අධිභාරයට යටත් තැනැත්තන් සම්බන්ධයෙන් වන විට අදාළ වේ.)

| I වන තීරය තැනැත්තා | II වන තීරය (මුදල රුපියල්වලින්) | III වන තීරය (මුදල රුපියල්වලින්) |
|---|---|---|
| 1. පුද්ගලයා ... ... | 25,293 ... | 20,980 |
| 2. කුඩා සමාගම් ; පුණ්‍යායතන ; සමුපකාර සමිති ; අන්‍යෝන්‍ය ජීවිත රක්ෂණ සමාගම් ; දේශීය ආදායම් පනතේ තුන්වන උපලේඛනයේ 12 වන විෂයයෙහි සඳහන් තැනැත්තන් ; කුඩා සමාගම් වල ඇවරකරුවෝ | 25,316 .. | 20,000 |
| 3. පොල්මඃකරුවෝ ; භාරගැනුම්කරුවෝ ; නො බෙදුණු හින්දු පවුල් | 25,547 | 17,500 |
| 4. ජනතා සමාගම් ; නිල ලැයිස්තුගත පොදු සමාගම් ; ජනතා සමාගම්වල හෝ නිල ලැයිස්තුගත සමාගම්වල ඇවරකරුවෝ | 25,862 .. | 15,000 |
| 5. හවුල් ව්‍යාපාර ; රාජ්‍ය සංස්ථා ; ආණ්ඩුව වෙත සතුකරනු ලැබූ වෙළෙඳ ව්‍යාපාර ; වාසික සමාගම් ; සමාගම්වල ඇවරකරුවෝ ; භාර කරුවෝ (භාරය 78.11.15 වන දිනට පෙර ඇතිකරනු ලැබූ අවස්ථාවක) | 26,315 ... | 12,500 |
| 6. නිර්වාසික සමාගම්, ශ්‍රී ලංකා ආණ්ඩුව සහ එක්සත් රාජධානියේ ආණ්ඩුව නොවන ආණ්ඩු ; භාරකරුවෝ (භාරය 78.11.15 වන දිනට හෝ ඉන් පසුව ඇති කරනු ලැබූ අවස්ථාවක) | 26,026 ... | 11,250 |

II වන කොටස

(සියයට 10 අනුප්‍රමාණයේ අධිභාරයට යටත් තැනැත්තන් සම්බන්ධයෙන් අදාළ වේ.)

| I වන තීරය<br>තැනැත්තා | II වන තීරය<br>(මුදල රුපියල්වලින්) | III වන තීරය<br>(මුදල රුපියල්වලින්) |
|---|---|---|
| 1. පුද්ගලයා ... ... | 51,577 ... | 35,090 |
| 2. නොබෙදුණු හින්දු පවුල් ... ... | 51,944 ... | 31,625 |
| 3. කුඩා සමාගම්, කුඩා සමාගම්වල ඇවරකරුවෝ ... | 50,746 ... | 39,500 |
| 4. පුණ්‍යායතන ; සමුපකාර සමිති ; අන්‍යොන්‍ය ජීවිත රක්ෂණ සමාගම් ; දේශීය ආදායම් පනතේ තුන්වන උපලේඛනයේ 12 වන විෂයයෙහි සඳහන් තැනැත්තන් | 50,641 ... | 39,500 |
| 5. පොල්මෑකරුවෝ සහ භාරගැනුම්කරුවෝ ... | 51,119 ... | 34,250 |
| 6. ජනතා සමාගම් ; නිල ලැයිස්තුගත පොදු සමාගම් ; ජනතා සමාගම්වල හෝ නිල ලැයිස්තුගත පොදු සමාගම්වල ඇවරකරුවෝ | 51,785 ... | 29,000 |
| 7. හවුල් ව්‍යාපාර ; රාජ්‍ය සංස්ථා ; ආණ්ඩුව වෙත සතුකරනු ලැබූ වෙළෙඳ ව්‍යාපාර ; වාසික සමාගම් ; සමාගම්වල ඇවරකරුවෝ ; භාර කරුවෝ (භාරය 78.11.15 වන දිනට පෙර ඇති කරනු ලැබූ අවස්ථාවක) | 52,778 ... | 23,750 |
| 8. නිර්වාසික සමාගම්, ශ්‍රී ලංකා ආණ්ඩුව සහ එක් සත් රාජධානියේ ආණ්ඩුව නොවන ආණ්ඩු ; භාරකරුවෝ (භාරය 78.11.15 වන දින හෝ ඊට පසු ඇති කරනු ලැබූ අවස්ථාවක) | 53,481 ... | 21,125 |

III වන කොටස

(සියයට 15 අනුප්‍රමාණයේ අධිභාරයට යටත් පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට අදාළ වේ.)

| I වන තීරය<br>තැනැත්තා | II වන තීරය<br>(මුදල රුපියල්වලින්) | III වන තීරය<br>(මුදල රුපියල්වලින්) |
|---|---|---|
| පුද්ගලයා ... ... | 2,13,137 ... | 93,784 |

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.